lkgazette.lkgazette.lkgazette.lkgazette.lkgazette.lkgazette

වවුනියාව මහා නගර සභාව

පළාත් පාලන ආයතනයන්හි පවතින රියදුරු තනතුරු සඳහා වන ඇබෑර්තු පිරවීම සඳහා අයදුම්පත් කැඳවීම - 2026

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2025.04.04 වෙනි දින අනුමත කරන ලද, වවුනියා මහා නගර සභා කාර්ය මණ්ඩල විස්තරවලට අනුවද, උතුරු පළාත් පළාත් පාලන කොමසාරිස් විසින් නිකුත් කරන ලද 2026.10.05 දතම අංක NP/14/1/ET/UNS/Gen/2026 දරන ලිපිය මගින් දක්වන ලද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ DMS/CAD/NP/Gen/Vac.Fill දරන 2026.09.24 දින අනුමැතිය ප්‍රකාරව වවුනියා මහා නගර සභාවේ රියදුරු තනතුර සඳහා පවතින පහත සඳහන් ඇබෑර්තු, 2013.01.01 දින සිට බල පැවැත්වෙන පරිදි උතුරු පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2013.07.30 වෙනි දින අනුමත කරන ලද උතුරු පළාත් පළාත් පාලන ආයතන සඳහා රියදුරු සේවාව සඳහා වන සේවා රෙගුලාසි සහ එහි සංශෝධනවලට අනුකූලව පිරවීම සඳහා සුදුසුකම් සපුරා ඇති අයවලුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

අනු අංකය	තනතුරේ නම	ශ්‍රේණිය	පිරවීම සඳහා අනුමැතිය ලබාදුන් ඇබෑර්තු සංඛ්‍යාව
01	රියදුරු	III වන ශ්‍රේණිය	08

01. වැටුප් පරිමාණය :

2025.03.25 වෙනි දතම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 හි 1 වන උපලේඛනයට අනුව වැටුප් කේත PL3-2025ට අදාළ මෙම තනතුර සඳහා වන මාසික වැටුප් පරිමාණය 42,780-10X490-10X540-10X590-12X630-66,540/- ක් වේ.

02. බඳවා ගැනීම සඳහා වන මූලික සුදුසුකම් :

- අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතුය.
- අයදුම්කරු අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු අවුරුදු 45 ට නොවැඩි අයෙකු විය යුතුය.
- දැනට පළාත් පාලන සේවයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි පත්වීම් ලද අයවලුන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.
- යහපත් චරිතයකින් යුත් මනා කායික යෝග්‍යතාවයක් ඇති අයෙක් විය යුතුය.
- අයදුම්කරු වවුනියා මහා නගර සීමාව තුළ වසර පහක (5) කාලයක් නොකඩවා ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය. වවුනියා මහා නගර බල ප්‍රදේශය තුළ එවැනි අයදුම්කරුවන් වෙතින් ප්‍රමාණවත් අයදුම්පත් ලැබී නොමැති නම් වවුනියා දිස්ත්‍රික්කයේ වසර පහක (05) කාලයක් නොකඩවා පදිංචිකරුවන්ට අවස්ථාව ලබා දෙනු ලැබේ. (ස්ථිර පදිංචිය තහවුරු කිරීම සඳහා ග්‍රාම නිලධාරී විසින් නිකුත් කර ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කළ පදිංචිය පිළිබඳ චරිත සහතිකයක් හෝ ඡන්ද නාම ලේඛනයේ උපුටුවක් අවශ්‍ය වේ.)

03. සේවා කොන්දේසි :

- මෙම තනතුර ස්ථිරයි. විශ්‍රාම වැටුප් සහිතයි.
- සේවක වැන්දඹු / වැන්දඹු පුරුෂ සහ අනත් දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතුය.
- ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කළ පරිදි ආයතන සංග්‍රහය සහ සම්මතයන් හි කොන්දේසි අදාළ වේ.
- කම්කරු, පළාත් මූල්‍ය රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නීතිරීති, ආයතන කාර්ය පටිපාටි නීති සංග්‍රහය සහ රජය, උතුරු පළාත් සභාව, අතිගරු ආණ්ඩුකාරතුමා, ප්‍රධාන ලේකම් විසින් විටින් විට නිකුත් කරනු ලබන අනෙකුත් නීති හා ක්‍රියාපටිපාටිවලට යටත්ය.
- පත්වීම්ලාභීන් වසර තුනක (03) කාලයක් පරිවාස කාලයක් යටතේ - පත් කරනු ලැබේ. දැනටමත් ස්ථිර සේවයේ නියුතු අයවලුන් වසරක (01) පරිවාස කාලයක් යටතේ පත්කරනු ලැබේ.
- දෙපාර්තමේන්තු ප්‍රධානි නියම කළහොත් ඒ සඳහා වන ඇප මුදලක් තැබීමට නිලධාරි යටත් විය යුතුය.
- පරිවාස පදනම යටතේ පත් කරනු ලබන නිලධාරියෙකුගේ සේවය, චරිතය හා පැමිණීම සතුටුදායකව පවතී නම් එම පරිවාස කාලයෙන් පසුව ඔහු තනතුරේ ස්ථිර කරනු ලැබේ.
- ඉහත කී පත්වීම ස්ථාන මාරුවීම්වලට යටත් නොවන අතර, පත්වීම්ලාභීන් වවුනියා මහා නගර සභාවේ සේවය කිරීමට බැඳී සිටිති.

04. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :

අධ්‍යාපනික සුදුසුකම් :

- අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයේ දෙවරකට නොවැඩි වාර ගණනකදී අවම වශයෙන් විෂයයන් දෙකක් සඳහා සම්මාන සාමාර්ථය සහිතව විෂයන් හයකින් (06) සමත්වී සිටිය යුතුය. එක් වාරයකදී අවම වශයෙන් විෂයන් පහකින් (05) සමත් වී තිබීම අනිවාර්යය වේ.

සහ

තනතුරට පවරන ලද කාර්යයන්ට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය කුසලතා (NVQ) 4 මට්ටමට නොඅඩු / ඒ හා සමාන වෘත්තීය පුහුණු සහතිකය / සුදුසුකම් සහතිකය ලබා තිබිය යුතුය.

සටහන : ඉහත සඳහන් අධ්‍යාපනික සුදුසුකම් සඳහා වන සහතික කරන ලද විභාග ප්‍රතිඵල අයදුම්පතට අමුණා එවිය යුතුය. එලෙස සහතික අමුණා නොමැති අයදුම්පත් සලකා බලනු නොලැබේ.

වෘත්තීය සුදුසුකම් :

- ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම, දියර අපද්‍රව්‍ය බැහැර කිරීම, පානීය ජලය සැපයීම වැනි සේවාවන් සඳහා වන වාහන සහ අනෙකුත් වාහන පැදවීමේ සුදුසුකම ලබා තිබිය යුතුය.

(උදා : පිකප්, වෑන්, බස් රථ, ට්‍රැක්ටර්, ගලි බවුසර්, මාර්ග තලන යන්ත්‍ර, මෝටර් ග්‍රේඩර්, ලොරි බවුසර්, බැකෝ ලෝඩර්, කොම්පැක්ටර්, ත්‍රීවිල් රථ යනාදිය)

මෝටර් රථ වාහන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද රියදුරු බලපත්‍රය ලබාගත් දිනයේ සිට අවම වශයෙන් වසර 03 ක පළපුරුද්ද ලබා තිබිය යුතුය. තවද, සැහැල්ලු සහ බර වාහන සහ ඉඩම් වාහන(ට්‍රැක්ටර් රථ) පංතියේ වාහන පැදවීමට සුදුසු රියදුරු බලපත්‍රයක් ලබා තිබිය යුතුය.

05. තෝරාගනු ලබන ක්‍රමය :

පිළිගනු ලබන සම්මුඛ පරීක්ෂක මඩුල්ලක් විසින් ඉහත සඳහන් තනතුර සඳහා වන සේවා රෙගුලාසි පරිදි ව්‍යුහගත කරන ලද සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන අතර, එහිදී ලබාගන්නා ලකුණු අනුපිළිවෙලින් තෝරාගනු ලබන අයවලුන් පළාත් පාලන ආයතනයන්හි භාවිත කරන වාහන පැදවීමේ දක්ෂතාවය පරීක්ෂා කිරීම සඳහා වෘත්තීය පරීක්ෂණයක් (Trade Test) පවත්වනු ලැබේ.

ලකුණු ලබා දෙන ප්‍රධාන කාණ්ඩ	උපරිම ලකුණු	තෝරා ගැනීම සඳහා ලබාගත යුතු අවම ලකුණු ප්‍රමාණය
අධ්‍යාපනික සුදුසුකම්	50	20
රැකියාව පිළිබඳ දැනුම	25	10
චරිතය සහ විනය	25	10
මුළු ලකුණු ගණන	100	40

වෘත්තීය පරීක්ෂණය සමත් වන අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය ලබාගත් ලකුණු අනුපිළිවෙලින් තෝරාගනු ලැබීමෙන් පත්වීම් සිදුකරනු ලැබේ.

06. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය : 2026.11.15

07. අයදුම්කරන ක්‍රමය :

1. කාර්යාල දිනයන්හි වවුනියා මහා නගර සභා කාර්යාලයේ ආදායම් ශාඛාවේ රු. 602.50ක් (වැට් බදු, SSCL බද්ද ඇතුළුව) ගෙවීමෙන් ලබාගත් ලදුපත ආයතන ශාඛාවට ඉදිරිපත් කර අයදුම්පත ලබාගත හැකිය. අයදුම්පත සම්පූර්ණ කර, අධ්‍යාපනික සුදුසුකම් සහ අනෙකුත් සුදුසුකම් පිළිබඳ සහතිකවල සහතික කළ පිටපත් සමග ලිපි කවරයේ බහා ඉදිරිපත් කළ යුතුය.
2. අයදුම්පතේ නිසි ලෙස අවශ්‍ය නිවැරදි තොරතුරු සම්පූර්ණ කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
3. අයදුම්පත් අයදුම්කරු විසින් පැහැදිලිව සම්පූර්ණ කර අත්සන් තබා ඉදිරිපත් කළ යුතුය.
4. අයදුම්පත සම්පූර්ණ කරන විට නිවැරදි තොරතුරු සඳහන් කළ යුතුය. සම්මුඛ පරීක්ෂණයට පෙර හෝ සම්මුඛ පරීක්ෂණයේදී හෝ සම්මුඛ පරීක්ෂණයෙන් පසුව අයදුම්කරු විසින් ඉදිරිපත් කළ යම් තොරතුරැක් සාවද්‍යයයි. නිරාවරණය වේ නම්, බඳවා ගැනීමේ නීති රෙගුලාසි ප්‍රකාරව අයදුම්කරු අයදුම් කිරීමට නුසුදුස්සෙකු ලෙස සලකා ඕනෑම මොහොතක ඔහුගේ අයදුම්පත ප්‍රතික්ෂේප කොට පත්වීම අත්හිටුවීම / අවලංගු කරනු ලැබේ.
5. සියලුම අයදුම්පත්, අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන 2026.11.15 වෙනි දින හෝ ඊට පෙර ලැබෙන පරිදි 'නාගරික කොමසාරිස්, මහා නගර සභාව, වවුනියාව' යන ලිපිනයට, කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුරේ නම (රියදුරු - III වන ශ්‍රේණිය තනතුරට බඳවා ගැනීම සඳහා අයදුම්පත) සඳහන් කොට ලියාපදිංචි තැපැල් මගින් යොමු කළ යුතුය. අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනෙන් පසුව ලැබෙන අයදුම්පත් සියල්ල ප්‍රතික්ෂේප කරනු ලැබේ.
6. ඉහත සඳහන් තනතුරට අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවනු ලබන කාලයේදී බඳවා ගැනීම ප්‍රමාද කිරීමේ, වෙනස් කිරීමේ හෝ අවලංගු කිරීමේ සම්පූර්ණ බලය වවුනියා මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සතුය.

සී. සිවරංජනි,
නාගරික කොමසාරිස්,
මහා නගර සභාව, වවුනියාව.

දිනය 2026.10.27

lkgazette.lkgazette.lkgazette.lkgazette.lkgazette.lkgazette